www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප ආරම්භක සමුලුවේ ලියවිලි: මූලධර්ම පිලිබඳ ප්‍රකාශය -- 2 වන කොටස

## Documents of the SEP Founding Congress: Statement of Principles—Part 2

**2008 සැප්තැම්බර් 26**

*සමාජවාදී සමානතා පක්ෂය (එක්සත් ජනපදය), සසප මූලධර්ම පිලිබඳ ප්‍රකාශයෙන් ආරම්භ කරමින්, සිය ආරම්භක සමුලුවේ ලියවිලි පල කිරීම අරඹා ඇත. එහි පලමු කොටස මීට පල වූ අතර පහත පල වන්නේ එහි දෙවන හෙවත් අවසන් කොටසයි.*

*මූලධර්ම පිලිබඳ ප්‍රකාශය, 2008 අගෝස්තු 3-9 දිනවල පැවති සම්මේලනය විසින් ඒකමතිකව සම්මත කරන ලදි. ඉදිරි දිනවල දී, ලෝක සමාජවාදී වෙබ් අඩවිය, සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික හා ජාත්‍යන්තර පදනම් නම් ලියවිල්ල ද ඇතුලු සසප සම්මේලනයේ ලියවිලි පල කරනු ඇත.*

### අවස්ථාවාදයට එරෙහිව

22. සියලු දේශපාලන ප්‍රශ්න කෙරේ ප්‍රවිෂ්ට වීමේ හා යෝග්‍ය උපායන් තෝරා ගැනීමේ දී, ධනේශ්වර සමාජයේ නියාම පාලිත ස්වභාවය හා පන්ති සමාජයේ දේශපාලන ගතිකයන් පිලිබඳ විද්‍යාත්මක අවබෝධය මත පදනම්ව, ඉතිහාසයේ පාඩම් ක්‍රමානුකූලව උකහා ගනිමින්, සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්තියේ මූලික අවශ්‍යතාවන් සැලකිල්ලට ගනියි. කෙටිකාලීන උපායික ජයග්‍රහන අත්කර ගැනීම සඳහා කම්කරු පන්තියේ දිගුකාලීන අවශ්‍යතාවන් කැපකිරීමෙහි යෙදී සිටින අවස්ථාවාදී දේශපාලනය කරෙහි එහි අශමනීය විරුද්ධත්වය ගලා එන්නේ මෙම ප්‍රවිෂ්ටයෙනි. මූලධර්ම පිලබඳව තමන් කල පාවාදීම් ආරක්ෂා කිරීමේ දී අවස්ථාවාදීන් යලි යලිත් කියා සිටියේ, තමන් අචිචලා අධානග්‍රාහය තුල කොටු නොවී, ඕනෑම දී ඇති තත්වයකට ගැලපෙන පරිදි සිය භාවිතාවන් හැඩගස්වා ගත හැකි, "යථාර්ථවාදී" දේශපාලඥයන් වූ බවයි. එවන් "යථාර්ථවාදී" දේශපාලනය යලි යලිත් ගමන් කලේ විනාශය කරාය. ඒ හරියට ම ඔවුන් පදනම් වූයේ, පන්ති අරගලයේ ගතිකයන් හා වෛෂයික තත්වයන් පිලිබඳ ගැඹුරක් නැති, ආවේගවාදී, මාක්ස්වාදී නොවන හා අවසාන වශයෙන් අයථාර්තවත් හා සාවද්‍ය අගැයීම් මත වීම නිසාය.

23. එහෙත් අවස්ථාවාදය වනාහි හුදෙක් බුද්ධිමය හා න්‍යායික දෝෂයක නිර්මානයක් නොවේ. එයට ධනේශ්වර සමාජයේ සැලකිය යුතු සමාජ-ආර්ථික මූලයන් තිබෙන අතර, කම්කරු ව්‍යාපාරය තුල සතුරු පන්ති බලවේගයන්ගේ පීඩනයෙහි ප්‍රකාශනයක් ලෙස වර්ධනය වී ඇත. 19 වන සියවස අවසානයේ ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඇතුලත නැගී ආ බර්න්ස්ටයින්ගේ ද, 1920 ගනන් වල බොල්ශෙවික් පක්ෂය තුල වැඩී ආ ස්ටැලින්ගේ ද, 1950 ගනන් මුල හතරවන ජාත්‍යන්තරය තුල වර්ධනය වූ පැබ්ලෝ හා මැන්ඩල්ගේ ද අවසන් වශයෙන්, 1980 ගනන් මැද භාගයේ ජාත්‍යන්තර කමිටුවෙන් බිඳීම කරා ගමන් කල, බ්‍රිතාන්‍ය කම්කරු විප්ලවවාදී පක්ෂයේ ද, යනාදී වශයෙන් අවස්ථාවාදයේ සියලු වැදගත් ප්‍රකාශනයන්, කම්කරු පන්තිය තුල ධනේශ්වර හා සුලු ධනේශ්වර සමාජ බලවේගයන් විසින් යොදන ලද බලපෑම් වෙතට සම්බන්ධ කල හැකිය. ඔවුන් මෙම පන්ති අවශ්‍යතාවන් තුල නැංගුරම් ලූ මොහොතේ පටන්, අවස්ථාවාදී ප්‍රවනතාවන්, මාක්ස්වාදී මූලධර්ම වලට හා මාක්ස්වාදී න්‍යායට ප්‍රහාරයක් වන, දෘෂ්ටිමය යුක්තිකරනයන් ගොඩනැගීමට පටන් ගනිති. අවස්ථාවාදී දේශපාලනයට සමීප සම්බන්ධකම් ඇති සංශෝධනවාදයේ යටින් ඇති කාරනය හා වැදගත් කම එයයි. එවන් ප්‍රවනතාවන්ට එරෙහි අරගලය පක්ෂ ගොඩ නැගීමෙන් ඉවතට හැරීමක් නොවන අතර එය කම්කරු පන්තිය තුල මාක්ස්වාදය සඳහා අරගලයේ ඉහල ම තුඩයි.

### සමාජවාදී විඥ්ඥානය හා නායකත්වයේ අර්බුදය

24. ජාත්‍යන්තර කමිටුව සමග දේශපාලන සහයෝගීතාවයෙන් කටයුතු කරන සමාජවාදී සමානතා පක්ෂය, විප්ලවවාදී සමාජවාදී විඥ්ඥානය, කම්කරු පන්තිය තුල ස්වයංසිද්ධව ගොඩ නොනැගෙන්නේය යන ලෙනින් විසින් බොල්ශෙවික් පක්ෂය ගොඩනැගීමේ දී ක්‍රමානුකූලව වර්ධනය කල හා ට්‍රොට්ස්කි විසින් හතරවන ජාත්‍යන්තරය ආරම්භ කර වර්ධනය කිරීමේ දී පෙරට ගෙන ගිය සම්භාව්‍ය මාක්ස්වාදී සංකල්පය ආරක්ෂා කරයි. සමාජවාදී විඥ්ඥානය සඳහා, ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ ඓතිහාසික සංවර්ධනය පිලිබඳ නීති තුලට, විද්‍යාත්මක දැක්මක් අවශ්‍ය කෙරේ. මෙම දැනුම හා වැටහීම කම්කරු පන්තිය තුලට ගෙන යා යුතු අතර, මාක්ස්වාදී ව්‍යාපාරයේ මූලික කර්තව්‍යය එයයි. කල යුත්තේ කුමක්

ද? කෘතිය තුල ලෙනින් අවධාරනය කරන්නේ හරියටම මේ කාරනයයි. ඔහු මෙසේ ලිවීයඃ "විප්ලවවාදී න්‍යායකින් තොරව විප්ලවවාදී ව්‍යාපාරයක් පැවතිය නොහැකිය." කම්කරු ව්‍යාපාරය තුලට මාක්ස්වාදී න්‍යාය ගෙනයාමට විප්ලවවාදී පක්ෂය දරන උත්සාහය නොමැති වූ විට කම්කරු පන්තියේ "ධනේශ්වර විඥ්ඥානය" ලෙස ලෙනින් අර්ථ දැක්වූ වෘත්තීය සමිති වාදය, කම්කරු පන්ති ජන සමූහයේ විඥ්ඥානය මත ආධිපත්‍ය දරන රූපය ලෙස පවතිනු ඇත. මාක්ස්වාදී විඥ්ඥානය සඳහා අරගලය හෙලාදැකීම, ප්‍රතිගාමී ශාස්ත්‍රාලිකයන් හා දේශපාලන අවස්ථාවාදීන් ගේ පුරුද්දක්ව තිබේ. එය සාමාන්‍යයෙන් මාක්ස්වාදී " ප්‍රභුවාදයේ" හා පන්ඩිත කමේ ලක්ෂනයක් බව ඔවුන් වාචාල ලෙස කියා සිටිති.

25. මානව ශිෂ්ඨාචාරයේ පැවැත්ම හා ප්‍රගතිශීලී වර්ධනය සඳහා සමාජවාදී විප්ලවය ජයග්‍රහනය කල යුතු අතර, සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය හතරවන ජාත්‍යන්තරයේ මාක්ස්වාදී න්‍යායික පදනම් මත ගොඩනැගීම එබැවින් අවශ්‍ය කෙරේ. සමාජවාදය, හුදෙක් අවිඥ්ඥානික ඓතිහාසික සන්තතියක ප්‍රතිපලයක් ලෙස සාක්ෂාත් නොවනු ඇත. 20 වන සියවසේ සමස්ත ඉතිහාසය ම සාක්ෂි දරන්නේ, ඓතිහාසික භෞතිකවාදී නියතිවාදයේ විකට රූපයක් වන එම ඉරනම්වාදී "අනිවාර්යතාවය", මාක්ස්, එංගල්ස්, ලෙනින් හා ට්‍රොට්ස්කි ගේ වැඩ කටයුතු වලින් ආදර්ශමත් කරන සංජානනය, න්‍යාය හා භාවිතයේ ගතික අන්තර් ක්‍රියාකාරිත්වය සමඟ මොනම සාම්‍යයක් වත් ඇත්තේ නැති බවට ය. 20 වන සියවසේ ධනවාදය පන බේරාගත්තේ වෛෂයික තත්වය සමාජවාදය සඳහා සෑහෙන තරම් මෝරා නොතිබීම නිසා නොව, කම්කරු පන්තික මහා පක්ෂවල නායකත්වය සමාජවාදී විප්ලවයට "නොසෑහීම" නිසා ය. කම්කරු පන්තිය දිරිමත් ලෙස යලි යලිත් අරගලයට පිවිසුනු නමුදු, ස්ටැලින්වාදීන්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් මාධ්‍යමිකයන් හා ප්‍රතිසංස්කරනවාදී සංවිධාන විසින් අවමංගත කරන ලදුව පරාජයන්ගෙන් කෙලවර විය.

26. ධනවාදය අද දිනයේත් පන රැකගෙන සිටින්නේ, කම්කරු පන්තියේ ම මහා දේශපාලන පක්ෂ හා වෘත්තීය සමිති විසින් සිදු කරන පාවාදීම නිසාය. "සමස්තයක් ලෙස ලෝක දේශපාලන තත්වය, ප්‍රධාන කොටම අංග ලක්ෂිතව ඇත්තේ, නිර්ධන පන්ති නායකත්වයේ අර්බුදයකිනි." හතරවන ජාත්‍යන්තරයේ ආරම්භක ලියවිල්ල පටන් ගන්නා ලියොන් ට්‍රොට්ස්කි ගේ එම වචන, සමකාලීන දේශපාලන යථාර්තයේ නිර්වචනයක් ලෙස ඉහල ම අදාලත්වයකින් යුක්තය. කම්කරු පන්තිය විප්ලවවාදී අරගලයන්ට කැඳවුම් කිරීම කෙසේ වෙතත්, පවත්නා ධනේශ්වර ලෝක පර්යායට විරුද්ධවාදියෙක් ලෙස පවා ඉදිරිපත් වන, කිසිදු මහජන සංවිධානයක් අද ලෝකයේ ඇත්තේ නැත. දේශපාලනිකව ඇසේ බැඳුනු පටලයක් වන් පැරනි සංවිධාන විසින්, කම්කරු පන්තියේ අතෘප්තිය හා කෝපය යටපත් කිරීමේ තතු තුල, මෙවන් විකාර සහගත වාතාවරයක් නිර්මිතව තිබේ. එහෙත් හතරවන ජාත්‍යන්තරයේ ආරම්භක ලියවිල්ල වන සංක්‍රමන ක්‍රියාමාර්ගය තුල ට්‍රොට්ස්කි යලිත් මෙසේ ලිවීය. "ජනතාවගේ දිශානතිය පලමුව තීරනය කරන්නේ දිරාපත් වන ධනවාදයේ වෛෂයික කොන්දේසි මඟින්ය. දෙවනුව පැරනි කම්කරු සංවිධානවල ද්‍රෝහී දේශපාලනයෙනි. මේ සාධක අතරින් පලමුවැන්න සත්තකින්ම තීරනාත්මකය. ඉතිහාසයේ නීති නිලධර පැලැන්තියට වඩා බලගතුය."

## මාක්ස්වාදි න්‍යාය හා කම්කරු පන්තිය

27. ධනේශ්වර පද්ධතියේ ප්‍රතිවිරෝධයන්, සමාජයේ විප්ලවවාදී ප්‍රති සංවිධානයක් ඇඟවුම් කරන අරගලයන්ට කම්කරු පන්තිය තල්ලු කරයි. මෙම අරගලයන් ජාත්‍යන්තර ස්වභාවයක් විශේෂිතව අත් කර ගන්නේ, නිෂ්පාදන බලවේගයන්හි ගෝලීය ඒකාග්‍රකරනයේ වැඩි දියුනු මට්ටමෙන් වෛෂයිකව නැඟී ඒම නිසාවෙනි. එබැවින් වත්මන් යුගයේ ප්‍රධාන මූලෝපායික කර්තව්‍යය, තීරනාත්මක ජාත්‍යන්තර විප්ලවවාදී බලවේගය ලෙස සෑම රටක ම කම්කරුවන්ගේ දේශපාලන එකමුතුව ගොඩනැඟීම ය.

28. විශේෂයෙන් ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ ප්‍රතිවිරෝධයන් තුලින් ප්‍රකාශයට පත්වන ආකාරයට. සමාජයේ හා ඉතිහාසයෙහි වෛෂයික නීති පිලිබඳ විශ්ලේෂනයක් මත, සමාජවාදී සමානතා පක්ෂය සිය වැඩ කටයුතු පිහිටුවයි. දාර්ශනික භෞතිකවාදය තුල මුල් බැසගත්, විඥ්ඥානය මත ද්‍රව්‍යයේ ප්‍රාථමිකත්වය, මාක්ස්වාදය අවධාරනය කරයි. "මිනිස් මනස තුල පිලිබිඹු කර ගන්නා හා චින්තනයේ රූපාකාරයන් බවට පරිවර්තනය කරන්නාවූ චින්තනය වනාහි, ද්‍රව්‍යමය ලෝකයට වැඩි යමක් නොවේ." යයි මාක්ස් ලිවීය. භෞතිකවාදී වූ මාක්ස්ගේ අපෝහකය තුල, ද්‍රව්‍යමය ලෝකය හා එහි චින්තන ප්‍රතිබිම්බයන්ගේ ආකෘතීන් සැලකිල්ලට ගන්නේ, ස්ථිතික අරමුනු හා සංකල්පවල එකතුවක් ලෙස නොව, ඇතුලතින් වෙන් නොවූ එහෙත්, ප්‍රතිසතිතාවෙන් හා අපසාරී ප්‍රවනතාවයන් ගෙන් සමන්විත, නිරන්තර චලනයේ හා අන්තර් ක්‍රියාකාරිත්වයේ පවතින ක්‍රියාවලීන්ගේ සංකීර්නයක් ලෙසය.

29. සසප, කම්කරු පන්තියේ වැඩිදියුනු කොටස් තුල, ඉතිහාසය පිලිබඳ විද්‍යාත්මක අවබෝධය වැඩිදියුනු කිරීමට වෙර දරයි. එනම් වත්මන් අර්බුදයේ යථා ස්වභාවය හා එහි ලෝක-ඓතිහාසික ඇඟවුම් වෙත සිත් යොමු කිරීමක් හා ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය හා ඉන් නැඟී ආ සමාජ සම්බන්ධතාවන් පිලිබඳ අවබෝධයයි. වෛෂයික ඓතිහාසික ක්‍රියාවලියක්

මඟින් නිර්මිත සමාජ විප්ලවය සඳහා වූ ද්‍රව්‍යමය විභවය, ස්වයං-විශ්වාසයේ හා පන්ති සවිඥ්ඥානකත්වයේ දේශපාලන ව්‍යාපාරයක් බවට පත් කිරීමට සසප සටන් වදියි. ලෝක සිද්ධීන් පිලිබඳ ඓතිහාසික භෞතිකවාදී විශ්ලේෂන විධි ක්‍රමය යොදා ගනිමින් සසප, ලෝක ධනේශ්වර අර්බුදය උත්සන්න වීමෙහි ප්‍රති විපාකයන් අපේක්ෂා කරන අතර එයට සූදානම් ද වේ. එමෙන් ම සිදුවීම්වල තර්කනය, මූලෝපායිකව මෙන් ම උපායාත්මකව ද සූත්‍රගත කරමින්, ඒ සඳහා අවශ්‍ය දේශපාලන ප්‍රතිචාරය අපේක්ෂා කරයි. සමාජයේ ප්‍රගතිශීලී හා සමාජවාදී පරිවර්තනයක් අත් කර ගත හැක්කේ දේශපාලනිකව සවිඥ්ඥානක කම්කරු පන්තියේ සමූහ අරගලයන් තුලින් පමනක් බව සසප අවධාරනය කරයි. ප්‍රචන්ඩත්වයට නැඹුරුවක් දක්වන හුදෙකලා පුද්ගලවාදී ක්‍රියා, කම්කරු පන්තියේ සාමූහික අරගලයට ආදේශකයක් ලෙස කිසි විටෙකත් යොදා ගත නොහැකි වේ. දේශපාලන අත්දැකීම පෙන්නුම් කරන තාක් දුරට, පුද්ගලවාදී ප්‍රචන්ඩත්වයේ ක්‍රියා, නිරන්තරයෙන්ම උසිගන්වනු ලබන්නේ ප්‍රකෝපකාරීන් විසිනි. ඒවා රාජ්‍යයේ අත ශක්තිමත් කරයි.

30. කම්කරු පන්තියට සත්‍ය පැවසීමේ අත්‍යවශ්‍ය විප්ලවකාරී සමාජවාදී මූලධර්මය, සසප සියලු තත්වයන් යටතේ ආරක්ෂා කරයි. පක්ෂ ක්‍රියාමාර්ගය පදනම් විය යුත්තේ දේශපාලන යථාර්තය පිලිබඳ විද්‍යාත්මක හා වෛෂයික තක්සේරුවක් මතය. අවස්ථාවාදයේ වඩාත්ම කපටි රූපය නම්, කම්කරුවන් සත්‍යයට මුහුන දීමට නුසූදානම්ය යන, තමන් ම ගොඩනඟන පදනම මත, මාක්ස්වාදීන්, පවත්නා ස්වාභාවික විඥ්ඥානය පිලිගත යුතුය යන්නයි. වඩාත් සංයුක්තව පැවසුව හොත්, පැවතිය යුතු යයි අවස්ථාවාදීන් කල්පනා කරන මට්ටමේ දී, ජනතාව අතර පැතිර ඇති අගතීන් හා ව්‍යාකූලත්වයට ක්‍රියාමාර්ගය යටත් කල යුතුය යන්නයි. මෙම බියගුලු ප්‍රවිෂ්ටය සලකුනු කරන්නේ මූලධර්මාත්මක විප්ලවවාදී දේශපාලනයේ න්‍යාය විරෝධයයි. 1938 දී ට්‍රොට්ස්කි මෙසේ ප්‍රකාශ කලේ ය. "ක්‍රියාමාර්ගය කම්කරු පන්තියේ වෛෂයික කර්තව්‍යයන් මිස කම්කරුවන්ගේ පසුගාමීත්වය ප්‍රකාශයට පත් නොකල යුතුය. එය වනාහි පසුගාමීත්වය ජයගෙන අභිබවා යාමේ උපකරනයකි. පලමු පේලියෙහි ම එක්සත් ජනපදයත් ඇතුලු, ධනේශ්වර සමාජයේ සමාජ අර්බුදයෙහි මුලු තීව්‍රත්වය ම අපගේ ක්‍රියාමාර්ගය තුල ප්‍රකාශිත විය යුත්තේ එබැවින්ය." පක්ෂය සතු පලමු වගකීම වන්නේ " වෛෂයික තත්වය ද, ඉන් ගලා එන ඓතිහාසික කර්තව්‍යයන් ද පිලිබඳ පැහැදිලි චිත්‍රයක්, කම්කරුවන් ඒ සඳහා අද දිනයේ පරිනත වී ඇද්ද නැද්ද යන්න නොසලකා සම්පාදනය කිරීමයි. අපගේ කර්තව්‍යයන් කම්කරුවන්ගේ මානසිකත්වය මත පදනම් නො වේ. කර්තව්‍යය කම්කරුවන්ගේ මානසිකත්වය වර්ධනය කරනු ඇත. වැඩි දියුනු කම්කරුවන් ඉදිරියේ ක්‍රියාමාර්ගය සූත්‍රගතකර ඉදිරිපත් කල යුත්තේ එබැවින් ය." මෙම වචන සසප විසින් ගනු ලබන ප්‍රවිෂ්ටය හරියට ම නිර්වචනය කරයි.

## වෘත්තීය සමිතිවල පාවා දීම

31. කම්කරුවන්ට සත්‍ය පැවසීමෙන් මඟහරින අවස්ථාවාදීන් සැම විටම බැඳී සිටින්නේ, ධනේශ්වර ක්‍රමයට කම්කරු පන්තිය යටත් කර තැබීම සඳහා පෙනී සිටින ප්‍රතිගාමී, ඇටුවන් බැහැපු නිලධාරිවාදී හා තරයේ ම ව්‍යාපාර ගැති පැරනි වෘත්තීය සමිති හා දේශපාලන සංවිධානවලට ය. අවස්ථාවාදීන්ට විරුද්ධව සසප, කම්කරු පන්තිය තුල වැඩ කරන ජනතාව නියෝජනය කරනවා යයි කියා සිටින පැරනි සංවිධාන, එක්සත් ජනපදය තුල නම් ප්‍රධාන කොට ම වෘත්තීය සමිතිවල ස්වභාවය පිලිබඳ අවබෝධයක් ගොඩ නැඟීම අරමුනු කර ගනියි. ඒඑෆ්එල්-සීඅයිඕ හා එහි පසමිතුරු කන්ඩායම වන ඊනියා "ජයග්‍රහනය සඳහා වෙනස" යන සභාගය පාලනය කරන්නේ, කම්කරු පන්තිය සූරාකෑමේ යෙදී සිටින සංගතයන්ට පහසුකම් සපයමින්, දැනුවත් හා ක්‍රියාශීලී වැඩ කොටසක් ඉටු කිරීම මඟින්, පුද්ගලික ආදායම් උපයාගන්නා සැලකිය යුතු මධ්‍යම පන්තික කාර්යධරයන් තට්ටුවකගේ අවශ්‍යතාවන් වෙනුවෙන් සේවය කරන්නවුන් විසිනි. පසුගිය විසිපස් වසර තුල ඔවුන්, වැඩ වර්ජන කඩාකප්පල් කිරීමේ, වැටුප් කැපීමේ, සහන හා පහසුකම් අහෝසි කිරීමේ, රැකියා කප්පාදුවේ හා කම්හල් වැසීමේ දී ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කර තිබේ. මේ තතු තුල සාමාජිකත්වය පහල වැටෙද්දී පවා වෘත්තීය සමිතිවල ආදායම හා ඒවායේ ක්‍රියාකාරිකයන්ගේ වැටුප් ඉහල නැඟීමට පටන් ගෙන තිබේ. අරමුදල් ගලාඒමත්, ඒ පිලිබඳ රෙගුලාසිවලින් මෙන්ම සාමාජිකයන්ගේ විරෝධතාවලින් විමුක්ත වීමත් මඟින් සමිති, දහසක් හුය පටවලින් සංගතවලට මෙන්ම රාජ්‍යයටත් එහි බුද්ධි ආයතනවලටත් බැඳී සිටිති. කම්කරු පන්තිය නියෝජනය නොකරන මෙම දූෂිත සංවිධාන වලින් බිඳී වෙන්වීමටත්. ඒවාට එරෙහි කැරලිකාරිත්වයක් සඳහාත් සසප කම්කරු පන්තිය කැඳවුම් කරයි. මේ තත්වය, සිය හාම්පුතුන්ගේ මෙන්ම සමිති ක්‍රියාකාරීන්ගේ ද ඒකාබද්ධ පීඩාවකට ලක්ව සිටින කම්කරුවන්ට සහාය දැක්වීමෙනුත්, සමිති තුල මැදිහත් වීමට අවශ්‍යවන තාක් දුරට එම සංවිධාන තුල වැඩ කිරීමෙනුත්, පක්ෂය වලක්වන්නේ නැත. එහෙත් පක්ෂය එවන් වැඩ කටයුතුවලට මැදිහත් වන්නේ, කම්හල් හා වැඩපලවල ක්‍රියාකාරී කමිටු වැනි ස්වාධීන සංවිධාන ගොඩනැඟීම සැම අවස්ථාවක ම දිරි ගන්වමින් හා විප්ලවවාදී ඉදිරිදර්ශනයක පදනම මතය. සැබෑ ලෙසම සමිති සාමාජිකයන්ගේ අවශ්‍යතාවන් නියෝජනය කරනු ඇත්තේ ද, ප්‍රජාතන්ත්‍රවදී පාලනයකට ඉඩක් ඇත්තේ ද එවන් සංවිධාන තුල පමනි.

## අනන්‍යතා දේශපාලනයට එරෙහිව පන්ති එකමුතුව

32. කම්කරු පන්තික එකමුතුව හා පන්ති විඥ්ඥානය බාල්දු කිරීමේ දී, අවස්ථාවාදය ඉටු කල තවත් වර්ගයක වැදගත් ක්‍රියා කලාපයක් නම්, ජාතික, වාර්ගික, ගෝත්‍රික, ආගමික, භාෂාමය, ලිංගිකත්වය හා ලිංගික සුවිශේෂත්වය, පන්ති තත්වයට උඩින් ඉහලට එසවීම මත පදනම්වූ "අනන්‍යතා" දේශපාලනයේ නිමක් නැති ක්‍රමවේදයන් හුවා දැක්වීමයි. පන්තිය වෙතින් අනන්‍යතාවය වෙතට සිදූ වූ මෙම මාරුව, ධනේශ්වර ක්‍රමය තුල මුල් බැස ඇති වැඩ කරන ජනතාව මුහුන දුන් සියලු දුෂ්කරතාවන් පිලිබඳ සැබෑ හේතු ගැන අනවබෝධයෙන් සිදුවූවා නො වේ. එහි නරකම අන්තයට ගිය කල ඔවුන්, අධ්‍යාපන ආයතනවලට හා රැකියාවලට ඇතුලුවීම හා අනෙකුත් "ඉඩප්‍රස්ථා" සැලසීමේ දී විවිධ "අනන්‍යතාවන්" අතර තරඟයට උඩගෙඩි දුන්හ. සමාජවාදී සමාජයක් තුල එවන් දේ අවමානයකින්, නො මිනිස්කමෙන් හා අහම්භ සුදුසු කමෙන් තොරව, සියලු ජනතාවට නොමිලයේ සැපයෙනු ඇත. එහෙයියන්ගේ ක්‍රියාකාරී කම්ටු වැඩි හරියකදී සහන සැලසුනේ සාපේක්ෂව කුඩා මධ්‍යම පන්තික ස්ථරයකට පමනි. 1950 හා 60 ගනන්වල ඓතිහාසික අප්‍රිකානු-ඇමරිකානු ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයන්හි ආධිපත්‍ය දරන ලද, නීතිමය සමානාත්මතාවය පිලිබඳ ඉල්ලීම, දේශපාලන යොමුවේ පන්ති මාරුව මඟින් පසෙකට තල්ලුවී ගිය අතර, දුගී භාවයට එරෙහි සටන, සුලු කොටසකගේ වරප්‍රසාද හා මනාප සැලකීම මඟින් විස්ථාපනය විය. ඩිමොක්‍රටික් පක්ෂ හා සුලු-ධනපති අනන්‍යතා දේශපාලනයේ බක පන්ඩිතයන් අතර සිටි ඩිමොක්‍රටික් පක්ෂ හිතවතුන් විසින් උත්කර්ෂයට නැංවූ මෙම මාරුවේ බලපෑම හමුවේ, සුලු ජාතික කම්කරුවන්ගේ පුලුල් කොටස්වල ජීවන තත්වයන් කෙරෙහි ව්‍යසනකාරී ප්‍රතිවිපාක ගෙන ආවේ ය. සසප සියලු ජනතාවගේ පූර්න සමානාත්මතාවය ඉල්ලා සිටින අතර ඔවුන්ගේ ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් නොපමාව ආරක්ෂා කරයි. ජාතික, වාර්ගික, ගෝත්‍රික, ආගමික හෝ භාෂා උරුමය, ලිංගිකත්වය හෝ ලිංගික දිශානතිය මත පදනම්වූ වෙනස්කම් කිරීම, අහෝසි කල යුතුය. කම්කරු පන්තියේ සියලු කොටස්වල දේශපාලන එකමුතුවේ පදනම මත, සමාජවාදය සඳහා අරගලයේ සන්දර්භය තුල සසප, සිය ක්‍රියාමාර්ගයේ දී මෙම අත්‍යවශ්‍ය ප්‍රජාතාන්ත්‍රික උපාංග පොහොසත් කරයි.

## ස්වදේශික හා සංක්‍රමනික ජනතා අයිතීන් සඳහා

33. මෙම එකමුතුව සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසියක් වන්නේ, එක්සත් ජනපද සංක්‍රමනිකයන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමයි. සමාජවාදී සමානතා පක්ෂය සෑම රටකම කම්කරුවන්ට තමන් කැමති ස්ථානයක ජීවත් වීමට හා වැඩ කිරීමට ඇති අයිතිය සඳහා කොන්දේසි විරහිතව පෙනී සිටියි. දැන් "නීති විරෝධී" හෝ ලේඛන ගත නොවූවන් ලෙස වර්ග කර ඇති මිලියන 12 කට වැඩි ජනතාව ද ඇතුලත්, සියලු සංක්‍රමනිකයන්ගේ පූර්න ප්‍රජාතන්ත්‍රීය පුරවැසි අයිතිය සඳහා අපි කැඳවුම් කරන්නෙමු. තව ද, මහාද්වීපික බලවතෙකු ලෙස නැඟී ඒමේදී, ඇමරිකානු ධනවාදයේ ලේ තැවරුනු උරුමය බවට පත්ව ඇති, ස්වදේශික ඇමරිකානුවන්ගේ නොඉවසිය හැකි ජීවන කොන්දේසි ඇතුලු ඔවුන්ගේ දුක් ගැනවිලි, සමාජවාදී සමානතා පක්ෂය විශේෂ අවධානයකින් ඉස්මතු කරයි. ඒ වන විටත් ඇමරිකානු මහාද්වීපය තුල වාසය කල ජනතාවට එරෙහිව සිදුකල අපරාධයන්, දුර දිග ගිය ඇමරිකානු ප්‍රජාත්‍රන්තවාදයේ වාර්තාවෙන් මගහැර තිබීම මඟින් පෙන්නුම්කරන්නේ, කුහකත්වයේ තරමයි. ආන්තික දරිද්‍රතාවය, ජාතික සාමාන්‍යයට වඩා සියයට 20 ක් අඩු ආයු කාලයක්, නිවාස හිඟකම වැනි මෙම අපරාධයන්ගේ සමාජ ප්‍රති විපාකයන්, ආන්ඩුවේ ආයතන විසින්, ස්වදේශික ඇමරිකානු ජනාවාස හා රක්ෂිතයන්හි සමාජ අවශ්‍යතාවන් පොදුවේ නොසලකා හැර තිබීමේ හේතුව මත, අද දක්වාමත් උග්‍ර අතට හැරෙමින් පවතියි.

## ආරක්ෂනවාදයට හා 'නිදහස් වෙලඳාම' ට එරෙහිව සමාජවාදී ප්‍රතිපත්ති

34. එක්සත් ජනපදය තුල රැකියා අහිමිවීමට පිලිතුර සොයාගත යුත්තේ ආරක්ෂනවාදය තුල යයි ජාතික ස්වොත්තමවාදීන් විසින් කර ඇති හා වෘත්තීය සමිති විසින් නො පැකිලව අනුමත කර ඇති ප්‍රකාශ මුලුමනින් ම සාවද්‍ය ය. ප්‍රායෝගික කාරනයක් ලෙස භූගෝලීයකරන යුගයේ දී, ආර්ථික ජාතිකවාදය කරා ආපසු යාමක් තිබිය නොහැකිය. එසේම අන්තර්ජාතික ඒකාධිකාරයන්ගේ හෙන්චයියන්, "නිදහස් වෙලඳම" වෙනුවෙන් කරන හඬනැඟීම, "නිදහස" සඳහා ඔවුන්ගේ අනෙක් සියලු ප්‍රනාමයන් මෙන්ම ප්‍රෝඩාකාරීය. ජාතික දේශසීමා අහෝසි කිරීමත්, තාර්කිකව ඒකාග්‍ර කල සැලසුම්ගත ආර්ථිකයක් නිර්මානය කිරීමත්, නිෂ්පාදන බලවේගයන්ගේ සමාජ අයිතියත් සඳහා මිස, සසප ආරක්ෂනවාදය හෝ "නිදහස් වෙලඳම" වෙනුවෙන් පෙනී නොසිටියි. සමාජවාදී සමානතා පක්ෂය පෙනී සිටින එම අරමුනු සාක්ෂාත් කර ගැනීම දෙසට ප්‍රධාන පියවරක් වන්නේ, ස්වේච්ඡා පදනමක උතුරු, මධ්‍යම හා දකුනු ඇමරිකාවේ එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනැඟීමයි.

## ප්‍රජාතන්ත්‍රීය මධ්‍යගතභාවය

35. කම්කරු පන්තියේ විප්ලවවාදී අරගලය සඳහා සංවිධානයක් අවශ්‍යවන අතර එය විනයකින් තොරව

නොපවතිනු ඇත. එහෙත් විනය නිලධාරිවාදී ලෙස ඉහලින් පැටවිය නොහැකිය. එය වැඩි දියුනු කල යුත්තේ මූලධර්ම හා ක්‍රියාමාර්ගය මත නිදහස් ලෙස ඇති කර ගන්නා එකඟතාවයක පදනමින්ය. ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවයේ මූලධර්ම මත පදනම් වන සසප සංවිධානාත්මක ව්‍යුහය තුල ප්‍රකාශයට පත් වන්නේ මෙම වැටහීමයි. ප්‍රතිපත්ති හා සුදුසු උපායන් සූත්‍රගත කිරීමේ දී, පක්ෂය තුල පූර්න ප්‍රජාතන්ත්‍රවාදය පැවතිය යුතුය. පක්ෂ ව්‍යවස්ථාවේ සඳහන් කරුනු හැර, අනෙකුත් අවස්ථාවල සසප ප්‍රතිපත්ති හා වැඩ කටයුතු පිලිබඳ අභ්‍යන්තර සාකච්ඡාව, සීමා පැනවීමකින් තොරව සිදුවිය යුතුය. නායකයන් සාමාජිකයන් විසින් තෝරා පත්කරගන්නා අතර විවේචනයට හා පාලනයට විවෘත විය යුතුය. විවේචනයට මුහුන දිය නොහැකි නායකත්වයට ඉදිරිපත්වන අපේක්ෂකයන් එක්සත් ජනපද ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ මූලාරම්භකයා වූ ජේම්ස් පී කැනන් ගේ වචන සැලකිල්ලට ගත යුතුය. "සත්‍යය කිසිවෙකුටත් හානි නොකර, ඔහුට සුදුසු තැන හිමිකර දෙයි." එහෙත් ප්‍රතිපත්ති සූත්‍රගත කිරීමේ දී පුලුල් සාකච්ඡා ද, විවෘත හා අව්‍යාජ හා විවේචන ද අවශ්‍යවන ආකාරයට ම, ක්‍රියාත්මක කිරීමේ දී දැඩි විනයක් ද ඉල්ලා සිටියි. පක්ෂය තුල ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඇති කර ගත් තීන්දුවලට සෑම සාමාජිකයෙක් ම බැඳී සිටියි. තීන්දු ක්‍රියාත්මක කිරීමේ දී, මධ්‍යගතභාවයේ මෙම අත්‍යවශ්‍ය අංගයට විරුද්ධවන හා විනය ගත වීමේ ඉල්ලීම සිය පුද්ගලික නිදහසට අකුල් හෙලීමක් ලෙස සලකන අය විප්ලවවාදී සමාජවාදීන් නොව, පන්ති අරගලයේ ඇඟවුම් හා ඉල්ලීම් වටහා නොගන්නා අරාජකවාදී හා පුද්ගලවාදීන් ය.

## පන්ති විඥ්ඥානය, සංස්කෘතිය හා ලෝක සමාජවාදී වෙබ් අඩවිය

36. එක්සත් ජනපදය තුලත් ජාත්‍යන්තරවත් කම්කරු ව්‍යාපාරයේ දේශපාලන, බුද්ධිමය හා සංස්කෘතික ආයාමයේ ඉමහත් වර්ධනයක්, සමාජවාදය සඳහා අරගලය විසින් ඉල්ලා සිටිනු ලැබේ. තත්කාර්යවාදී හා අවස්ථාවාදී දේශපාලනයේ නියුතු වූවන්ට සපුරා වෙනස් ලෙස සසප, සිය ධජය වෙත කම්කරු පන්තිය දිනාගැනීමේ ද, එය ධනවාදයට එරෙහි අරගලයට සූදානම් කිරීමේ ද, ඉන් එහාට සමාජවාදී සමාජයක් ගොඩනැගීමේ ද හැකියාවෙන් යුතු බව සනාථ කරනු ඇත්තේ ඉහල ම න්‍යායික මට්ටමක වැඩ කරන ව්‍යාපාරයක් පමනක් බව ඒත්තු ගෙන සිටියි. ධනේශ්වර දේශපාලඥයින් කම්කරු පන්තිය තමන්ගේ හීන බුද්ධිමය මට්ටමට කප්පාදු කිරීමට උත්සුක වන අතර සසප, කම්කරු පන්තිය එහි ඓතිහාසික කර්තව්‍යයන් ඉටු කල හැකි මට්ටමට ඔසවා තැබීම සඳහා සටන් වදියි. දේශපාලනය පමනක් නොව, විද්‍යාව, ඉතිහාසය, දර්ශනවාදය, සාහිත්‍යය, චිත්‍රපට, සංගීතය, ලලිත කලා යන සංස්කෘතියේ සියලු ක්ෂේත්‍රයන් සමාජවාදයේ අධ්‍යයන පරාසයට ඇතුලත් වේ. කම්කරු පන්තිය තුල සමාජවාදී විඥ්ඥානය ගොඩනැගීමේ දී පක්ෂයේ වැදගත්ම අවිය වන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියයි, ලෝක දේශපාලනය හා ආර්ථික වර්ධනයන් පිලිබඳ එහි දෛනික විශ්ලේෂන ද, ධනේශ්වර සමාජ සම්බන්ධතා නිරාවරනය කිරීම ද, කම්කරු අරගල ආවරනය කිරීම ද, වැදගත් සංස්කෘතික ප්‍රශ්න මත කෙරෙන සාකච්ඡාවන් ද, ඓතිහාසික හා දාර්ශනික තේමාවන් ඔස්සේ පැවැත්වෙන විවාද ශීලී සාකච්ඡාවන් ද, විප්ලවවාදී මූලෝපාය, ක්‍රමෝපායන් හා භාවිතාව විමර්ශනය කිරීම ද සමඟ ලොසවෙඅ, සමකාලීන මාක්ස්වාදී ලෝක ව්‍යාපාරය පන්නර ගැන්වීමේ ලා තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කරයි.

## විප්ලවවාදී මූලෝපාය හා සංක්‍රමන ඉල්ලීම්

37. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමඟ දේශපාලන සහයෝගීතාවය පවත්වන සමාජවාදී සමානතා පක්ෂයේ මූලෝපායික අරමුන වන්නේ, කම්කරු බලය පිහිටුවීම හා සමාජවාදී සමාජයක් නිර්මානය කිරීම සඳහා, ධනේශ්වරයට එරෙහි විප්ලවවාදී අරගලයට කම්කරු පන්තිය උගන්වා ගැනීම ද සූදානම් කිරීම ද වේ. අපගේ අරමුන ධනවාදය ප්‍රතිසංස්කරනය කිරීම නොව පෙරලා දැමීමයි. කෙසේ වුව ද, මෙම අරමුන මුදුන් පමුනුවා ගැනීමට, කම්කරුවන්ගේ පුලුල් කොටස්වල ජීවන තත්වයන් කෙරෙහි බැරෑරුම් හා සවිස්තර අවධානයක් යොමු කිරීමත්, ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ඇමතීමේ ඉල්ලීම් කෙටුම්පත් කර ගැනීමත් අවශ්‍යය. සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය හා කම්කරු පන්තිය යෙදීගෙන සිටින සංයුක්ත අරගලයන් අතර, භාවිතයේ දී පුරුකක් ගොඩනඟා ගැනීමේ අවශ්‍යතාවය පක්ෂය හඳුනාගෙන ඇත. මෙම කර්තව්‍යයේ දී පක්ෂයට මඟ පෙන්වන්නේ ලියොන් ට්‍රොට්ස්කි විසින් සංක්‍රමන ක්‍රියාමාර්ගය තුල යොදාගත් ප්‍රවිෂ්ටය මඟිනි. ඔහු මෙසේ ලිවීය: "දිනපතා අරගලයේ ක්‍රියාවලිය තුල මහජනතාවට, වර්තමාන ඉල්ලීම් හා විප්ලවයේ සමාජවාදී වැඩ පිලිවෙල අතර පාලමක් සොයා ගැනීමට උදව් කිරීම අවශ්‍ය ය. කම්කරු පන්තියේ පුලුල් ස්ථරයන්ට, අද දිනයේ තත්වයන් හා අද දිනයේ විඥ්ඥානයෙන් පැනවී ඇති සීමාවන් ඉක්මවා, අවසන් නිගමනය එනම් නිර්ධන පන්තිය විසින් බලය අල්ලා ගැනීම කරා නො වෙනස්කල හැකි පරිදි මෙහෙය වෙන සංක්‍රමන ඉල්ලීම් ක්‍රමයක් මෙම පාලමට ඇතුලත් විය යුතුය."

38. එවන් ඉල්ලීම්වලට, සර්ව ලෝක රැකියා, මනා සෞඛ්‍ය පහසුකම් සීමාවකින් තොරව ලබාගැනීමේ හැකියාව, සර්ව ලෝක අධ්‍යාපනය, නිවාසවලින් දොට්ට දැමීම හා අත්පත්කර ගැනීම අවසන් කිරීම, උද්ධමනයට සරිලන පරිදි වැටුප් ඉබේ සකස්වන ක්‍රමයක්, වැඩපොලවල් ප්‍රජාතන්ත්‍රීය කරනය, මූල්‍ය හා ව්‍යාපාරික ආයතනවල මූල්‍ය වාර්තා මහජනතාවගේ

පරීක්ෂනයට විවෘත කිරීම, විධායක වැටුප් මත සීමාවන් පැනවීම, වැටුප් අඩු නොකර වැඩ කාලය අඩු කිරීම, හිමිකම් අනුව දැවැන්ත පුද්ගලික ධනය පැවරුම් මත, සැලකිය යුතු සීමාවන් හා අව්‍යාජව ම ප්‍රගතිශීලී ආදායම් බදු ක්‍රමයක්, ජාතික හා ගෝලීය ආර්ථිකයට වැදගත් වන දැවැන්ත සමාගම්වල ප්‍රජාතන්ත්‍රීය කම්කරු පාලනය හා ජනසතු කිරීම, ජාතික "ස්වෛච්ඡා" හමුදාව විසුරුවා හැරීම හා කම්කරු පන්තිය හා තෝරා පත්කල නිලධරීන් විසින් පාලනය කරන මහජන හමුදාව වෙත බලය මාරු කිරීම ඇතුලු සමාජීය වශයෙන් ප්‍රයෝජනවත් හා ප්‍රජාතන්ත්‍රවාදී අනෙකුත් ඉල්ලීම් ඇතුලත් විය යුතුය.

39. කම්කරු පන්තිය දේශපාලනිකව බලමුලු ගැන්වීම තුල, එය සමාජවාදී විඤ්ඤානය ගොඩනැඟීමේ පුලුල් ව්‍යායාමයක කොටසක් වන තාක් දුරට, සංක්‍රමන ඉල්ලීම් වැදගත් ක්‍රියා කලාපයක් ඉටු කරනු ඇත. සංක්‍රමන ක්‍රියාමාර්ගය වනාහි, අනුරූප වන දේශපාලන සන්දර්භයකින් හෝ පුලුල් දේශපාලන අරමුනු කරා යොමු නොවන, තෝරා ගත හැකි ආහාර වට්ටෝරුවක් නො වේ. සංක්‍රමන ක්‍රියාමාර්ගය, සමාජවාදය කරා පාලමක් ලෙස සලකන්නේ නම් ගමනාන්තය කම්කරු පන්තියෙන් සඟවා තැබිය නොහැකිය.

## කම්කරු පන්තිය හා සමාජවාදී විප්ලවය

40. වැඩි දියුනු විද්‍යාත්මක න්‍යාය හා ආඪ්‍යවත් ඓතිහාසික අත්දැකීම් මත පදනම් වූ සසප වැඩ කටයුතු, කම්කරු පන්තියේ විප්ලවවාදී ක්‍රියා කලාපය හා එහි ඉරනම පිලිබඳ නොසැලෙන විශ්වාසයක් ගැබ් කර ගනියි. එහෙත් සමාජවාදී විප්ලවයේ ජයග්‍රහනය පදනම් වන්නේ කම්කරුවන්ගේ සවිඤ්ඤානක අරගලයන් මතය. අවසාන විග්‍රහයේ දී කම්කරු පන්තියේ විමුක්තිය, කම්කරු පන්තියේ ම කර මත රැඳී ඇත. එංගල්ස් එය මනාව ගෙන හැර දැක්වූයේ මෙසේය. "සමාජ සංවිධානයේ මුලු මහත් පරිවර්තනයක් පිලිබඳ ප්‍රශ්නය මතුව තිබෙන විට, ජනතාව ම ඒ තුල ක්‍රියාකාරී විය යුතුවාක් මෙන්ම, පරදුවට තැබී ඇත්තේ කුමක් ද, තමන් සටන් සටන් වදින්නේ කුමක් සඳහා ද යන්න ශරීරයෙන් හා ආත්මයෙන් ම ඔවුන් දැනටමත් ග්‍රහනය කර තිබිය යුතුය." එහෙත් සමාජවාදය ගොඩනැගිය හැක්කේ කම්කරුවන්ට ම එය අවශ්‍ය නම් පමනි. එසේ ම, අර්බුද ග්‍රස්ත ධනවාදයේ ප්‍රහාරයන් යටතේ එම තීරනය ගත්කල, ලෝක සමාජවාදී විප්ලවයේ පෙරටු බල ඇනිය තුල ඇමරිකානු කම්කරුවන් සිය ස්ථානය ගැනීම වැලැක්විය හැකි කිසිදු බලවේගයක් මිහිපිට නොපවතිනු ඇතැයි කිව හැක.

© www.wsws.org